# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2019 අංක 2 දරන යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 ජනවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 ජනවාරි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 අංක 2 දරන යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත**

[සහතිකය සටහන් කළේ 2019 ජනවාරි මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 25/2017

**වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් යම් තැනැත්තකුගේ මරණය සිදුවීම සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක 2 දරන යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නඩුවක් පවත්වාගෙන යෑමේ අයිතිය.

**2.** (1) යම් තැනැත්තකුගේ මරණය වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් සිදුවන අවස්ථාවක දී, එම යම් තැනැත්තාගේ මරණය සිදුවූයේ වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාව, නොකර හැරීම, අතපසු කිරීම හෝ පැහැර හැරීම හේතුවෙන් ද, එම වෙනත් යම් තැනැත්තාට එරෙහිව අලාභ අය කරගැනීම සඳහා නඩුවක් පවත්වාගෙන යෑමට, (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු වෙත අයිතියක් තිබිය යුතු ය.

(2) (අ) කලත්‍රයා;

(ආ) දෙමව්පියන්ගෙන් අයකු හෝ දෙමව්පියන් එක්ව;

(ඇ) ළමයකු හෝ ළමයින් එක්ව;

(ඈ) සහෝදර සහෝදරියන්ගෙන් අයකු හෝ සහෝදර සහෝදරියන් එක්ව;

(ඉ) සීයා හෝ ආච්චි හෝ සීයා හා ආච්චි එක්ව; හෝ

(ඊ) භාරකරු,

විසින් නඩුව පවත්වාගෙන යා හැකි ය.

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ.

**3.** යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා වූ නඩුවක දී, ඉල්ලුම්කරු විසින්—

(අ) එම තැනැත්තාගේ ආදරය සහ කරුණාව මෙන්ම රැකවරණය සහ සහසම්බන්ධතාව අහිමිවීම සම්බන්ධයෙන්; සහ

(ආ) මානසික වේදනාව සහ පීඩාව සම්බන්ධයෙන්,

අලාභ අය කරගනු ලැබිය හැකි ය.

අනුප්‍රාප්තිය සඳහා අයිතියක් නැති බව.

**4.** (අ) මේ පනත යටතේ හිමිකම් පෑමක් කිරීමට පෙරාතුව; හෝ

(ආ) හිමිකම් පෑමක් කිරීමෙන් පසුව එහෙත් නඩු තීන්දුව ලබා දීමට පෙරාතුව,

ඉල්ලුම්කරු මියයන අවස්ථාවක දී, අලාභ ලබාගැනීම සඳහා මියගිය ඉල්ලුම්කරුගේ උරුමක්කරුවන්ට, පොල්මඃකරුවන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට කිසිදු අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

විද්වතකුගේ සහාය ලබාගැනීම.

**5.** මේ පනත යටතේ වූ යම් කරුණක් තීරණය කිරීමේ කාර්යය සඳහා, අධිකරණය විසින් සලකා බලනු ලබන කරුණට අදාළව යම් විශේෂිත කුසලතාවයක් ඇති තැනැත්තන් එක් අයකුගේ හෝ වැඩි දෙනකුගේ සහාය ලබා ගැනීම සඳහා කැඳවනු ලැබිය හැකි ය.

අත්හැර දැමීමක් සිදු වී ඇති අවස්ථාවක දී අලාභ ගෙවීම.

**6.** මියගිය තැනැත්තා අත්හැර දමා ඇත්තා වූ යම් තැනැත්තකුට මේ පනත යටතේ අලාභ ඉල්ලීම සඳහා හිමිකමක් නොතිබිය යුතු ය.

වෙනත් යම් ප්‍රතිකර්මයකට අතිරේකව මේ පනතේ විධිවිධාන පවතින බව.

**7.** මේ පනතේ විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක් හෝ අලිඛිත නීතියක් මඟින් විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් අයිතියකට හෝ ප්‍රතිකර්මයකට අතිරේකව විය යුතු මෙන්ම සහ එම අයිතිය හෝ ප්‍රතිකර්මය එමඟින් අඩු කරනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.